# යුරෝපීය නව සම්භාව්‍යවාදී කලා ප්‍රවණතාව

අසිත අමරකෝන්

The artistic style know as "Neoclassicism" was the predominant movement in European art and architecture during the late 18th and early 19th centuries. It reflected the desire to imitate the spirit and form of classical art and culture. The increasing interest of classical antiquity in the artistic style and the development of taste in European art of this period was greately influenced by the freshly discovered archaeological ruins of the classical world. Additionally, the theoretical and historical writings savoring the classical antiquity, notably that of Johann Joachim Winckelmann, contributed to this change in taste. Neoclassicism was also, in part, built on the prevailing mood of Enlightenment, and a reaction aginst the decadent frivolity of the Rococo style and the social class which catered to Rococo art. Moreover, classical ideals which reflect the pinnacle of civilised society were more appealing to Enlightenment and its emphasis on rationality. This paper thus addresses the various factors that prodded the rise of the Neoclassical movement in European art.

---

© අසිත අමරකෝන්

සංස්. පී. ඒ. අමිල මදුසංක, ජයමල් ද සිල්වා, දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ,
චන්දන රුවන් කුමාර, එච්. ඒ. ගිහාන් මධුසංඛ, නන්දුලා පෙරේරා
**'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, සිවු වැනි කලාපය - 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

දහඅට වන සියවසේ අගභාගයේ සහ දහනව වන සියවසේ මුල්භාගයේ යුරෝපයේ ප්‍රචලිත ව පැවති ප්‍රධානත ම කලා ව්‍යාපාරය වූ නවසම්භාව්‍යවාදයෙහි (Neoclassicism) මූලික ලක්ෂණය වූයේ ග්‍රීක හා රෝම කලාවන්ගේ සාරය මෙන් ම දෘශ්‍ය ආකෘතීන් ප්‍රතිනිර්මාණය කිරීමට දැක්වූ ලැදියාවයි. එමෙන් ම එය ඒ වන තෙක් ප්‍රචලිත ව පැවති රොකොකො (Rococo) කලාවේ නිස්සාර සැරසිලි සහිත දෘශ්‍ය ආකෘතීන්ට එරෙහි ප්‍රතිචාරයක් ලෙසින් ද හැඳින්විය හැකි ය. පෞරාණික සම්භාව්‍ය කලාවේ පැවති පිළිවෙළ, පැහැදිලි බව, තාර්කික බව මෙකල ප්‍රචලිත වූ ආලෝකන (Enlightenment) අදහස් වලට ද ගෝචර විය. නවසම්භාව්‍යවාදී සන්දර්භය තුළ ග්‍රීක හා රෝම සංස්කෘතිය සෞන්දර්යාත්මක ව මෙන් ම සදාචාරාත්මක අර්ථයෙන් ද උත්කර්ෂයට පත් විය. විශේෂයෙන් ප්‍රංශයේ දී එය විප්ලවවාදී අදහස් හා බැඳී, පෞරාණික සම්භාව්‍ය සමාජ ආචාර ධර්ම හා අගයන් සිවිල් සමාජය තුළ ස්ථාපිත කිරීමට යොදා ගැනුණි. මෙම ප්‍රවණතාවයෙහි ප්‍රබලත ම ප්‍රකාශනය ප්‍රංශයේ දී ශාක් ලුයී දවීද්ගේ (Jacques-Louis David 1748-1825) සිතුවම් තුලින් හඳුනාගත හැකි ය. නමුත් නවසම්භාව්‍යවාදය බිහි වූයේ රෝමය කේන්ද්‍ර කර ගනිමිනි. රෝමයේ සිටි ජර්මානු ජාතික විද්වතෙකු වූ යොහන් යෝකීම් වින්කල්මාන් (Johann Joachim Winckelmann 1717-1768) සහ ජර්මන් ජාතික චිත්‍ර ශිල්පියෙකු වූ ඇන්ටන් රෆායෙල් මෙන්ග්ස් (Anton Raphael Mengs 1728-1779) මෙම ප්‍රවණතාවයේ පුරෝගාමීන් ය.[1] මෙම අවධියේ යුරෝපයේ විවිධ රටවලින් පැමිණි විවිධ ශිල්පීහු රෝමය ආශ්‍රිත ව සිය වෘත්තීමය හෝ අධ්‍යයන කටයුතු සිදු කරමින් සිටියහ. මෙම ශිල්පීන්ගේ කලා ශෛලිය ප්‍රබෝධමත් වූයේ පෞරාණික සම්භාව්‍ය කලාව ආශ්‍රයෙනි. අන්තෝනියෝ කැනොවා (Antonio Canova 1757-1822), ඇන්ජලිකා කෆ්මාන් (Angelica Kauffman 1741-1807), ජොන් ෆ්ලක්ස්මාන් (John Flaxman 1755-1826), ගැවින් හැමිල්ටන්, තෝර්වල්ඩ්සන් (Bertel Thorvaldsen 1770-1844), ආදි යුරෝපීය ශිල්පීන් මෙන් ම හොරෙෂියෝ ග්‍රෙනව් (Horatio Greenough 1805-1852), වැනි ඇමරිකානු ශිල්පීන් ද සිය වෘත්තියේ වැදගත් ම කාලය (හෝ වැඩි කාලයක්) ගත කළේ රෝමය ආශ්‍රිතව ය.[2] මෙනිසා රෝමයේ බිහි වී වර්ධනය වූ නවසම්භාව්‍යවාදී කලා ප්‍රවණතාවය යුරෝපය පුරා මෙන්

ම ඇමරිකාව දක්වා ද ව්‍යාප්ත විය. නවසම්භාව්‍යවාදය පුද්ගලික ප්‍රකාශනයන්ට වඩා පූර්වයෙන් අනුමත (සම්භාව්‍ය කලාවේ) ආකෘති අනුව නිර්මාණ කිරීම ගරු කළ බැවින් මෙලෙස ජාත්‍යන්තර ව ව්‍යාප්ත වීම වේගවත් විය. එසේ ම සමකාලීන යුරෝපයේ වර්ධනය වෙමින් පැවති නව සමාජ, ආර්ථික, දේශපාලනික තත්ත්වයන් ආමන්ත්‍රණය කළ ආලෝකන අදහස් හා සැසඳෙන ආකාරයේ උදාරත්වයක් කලාවට එක් කළ හැකි දර්ශනවාදයක් ලෙස සීඝ්‍රයෙන් යුරෝපය පුරා ප්‍රචලිත විය.[3] නවසම්භාව්‍යවාදය බිහිවීම හා වර්ධනය වීම සම්භාව්‍ය කලාව හා සංස්කෘතිය මත පදනම් වීම කෙරෙහි බලපෑ සාධක කීපයක් හඳුනාගත හැකි ය.

## ආලෝකන අදහස් හමුවේ රොකොකො කලාව ප්‍රතික්ෂේප වීම

දහඅට වන සියවස අගභාගයේ ව්‍යාප්ත වූ ආලෝකනය (Enlightenment) මගින් සමස්ත යුරෝපය ම දේශපාලනික හා සමාජීය වශයෙන් විශාල පරිවර්තනයකට ලක් වෙමින් පැවතිණි. රදළවාදයේ ආධිපත්‍යයෙන් ගැලවී නිදහස හා ආර්ථික බලය සොයා ගිය නව මධ්‍යම පාංතිකයන් (Bourgeoisie) පිරිසක් මෙම ආලෝකන අදහස් මගින් බිහි විය. මෙම චින්තන විප්ලවයේ දර්ශනවාදය නිරූපණය කිරීමට ඒ වන විට ප්‍රචලිත ව පැවති බැරොක් හෝ රොකොකො කලාවන්ට නොහැකි වි ය.[4] එමෙන් ම ආලෝකන අදහස් මගින් කලාව නිෂ්පාදනය මෙන් ම කලාවෙන් ඉටු විය යුතු කාර්යය (role) පිළිබඳ පුළුල් ලෙස කතිකාවට ලක් කෙරුණි. කලාව මගින් සාරධර්ම හා ශිෂ්ට අගයන් එක් රැස් කොට ඒවා ආරක්ෂා කිරීමත්, බුද්ධිරෝධනවාදීන් (obscurantism) යටපත් කරමින් ඒවා ප්‍රචලිත කිරීමත් අපේක්ෂා කෙරිණි.

මෙම අවධියේ යුරෝපයේ ප්‍රචලිත ව පැවති රොකොකො ශෛලිය මූලික වශයෙන් රදළ සමාජ පංතිය අරමුණු කර ගත්තක් විය. එහි ශෝභාව හා චමත්කාරජනක ගති ස්වභාවය සැබෑ ලෝකයේ වර්ධනය වෙමින් පැවති අර්බුදකාරී තත්ත්වයන්ගෙන් මෙම සමාජ පංතිය වෙන් කළ ආවරණයක් විය. සුඛෝපභෝගී විනෝද සවාරි, ආදරවන්තයින්ගේ දර්ශන සහිත අතිශයෝක්තියෙන් වර්ණවත් කළ රොකොකො ශෛලිය ජීවිතය පිළිබඳ අතාත්වික නිරූපණයක් විය.

එය සමස්තයක් ලෙස ආලෝකන චින්තකයන් අතිශයින් ප්‍රතික්ෂේප කළ දෘෂ්ඨියක් විය.[5] කලාව සමාජ අගයන් ප්‍රජාව වෙත සම්ප්‍රේෂණය කිරීමට යොදා ගත හැකි කෘත්‍යාත්මක හා ප්‍රයෝජ්‍යාත්මක උපකරණයක් ලෙස සලකන ලදී. එබැවින් රොකොකො කලාවේ තිබූ කෘත්‍රිම අසත්‍ය ගති ස්වභාවයන් තවදුරටත් පවත්වාගෙන යාම ආලෝකන චින්තකයන් ප්‍රතික්ෂේප කිරීමත් සමග ආලෝකන අදහස් හා සැසඳෙන නව කලා ප්‍රවණතාවයක අවශ්‍යතා ව ඇති විය.

ආලෝකන චින්තකයෙකු වූ ශෝං-ශාක් රූසෝ (Jean-Jacques Rousseau 1712 - 1778) ගේ අදහස් කලාව නව මගකට යොමු කරවීමට උපකාරී විය. රූසෝගේ අදහස වූයේ කලාව, විද්‍යාව, සමාජය හා ශිෂ්ටාචාරය යන සියල්ල මගින් 'ප්‍රාකෘත හෙවත් ස්වභාවික මානවයා' (Natural Man) දූෂ්‍යයට ලක් කර ඇති බවයි. මානව වර්ගයාගේ ගැලවීම (Salvation) රඳා පවතින්නේ නැවත මුල් ප්‍රාකෘත තත්ත්වයකට (the ignorance, innocence, and happiness) පත්වීමෙන් පමණක් බව ඔහු අවධාරණය කළේ ය.[6] 'ප්‍රාකෘතය' (Natural) පිළිබඳ රූසෝගේ මෙම අදහස් මගින් රොකොකො කලාවේ කෘත්‍රිම හා නිස්සාර (artifical and frivolous) ගති ස්වභාවයන් ප්‍රතික්ෂේප විය. ශොං-බප්ටිස්ට් සිමෙයෝං ශර්ඩෑං (Jean-Baptiste-Siméon Chardin 1699 - 1779) රූසෝගේ අදහස් නිසා ප්‍රබෝධමත් වූ ශිල්පියෙකි. සාමාන්‍ය ජනයාගේ සරල දිවි පැවැත්ම නිරූපණය කළ ඔහුගේ සිතුවම් රොකොකො කලාවෙන් වෙනතකට යොමු වීම සනිටුහන් කරයි. ගෘහාශ්‍රිත පරිසරයන්හි මවුන් හා දරුවන් සහිත තේමා නිරූපිත ඔහුගේ සිතුවම් ආලෝකන චින්තකයන්ගේ පැසසුමට ලක් විය. ශෝං-බප්ටිස්ට් ග්‍රෑස් (Jean-Baptiste Greuze 1725 - 1805) රූසෝගේ අදහස් මගින් ප්‍රබෝධමත් වූ තවත් ශිල්පියෙකි. කලාව මගින් ඉටු විය යුතු සමාජ මෙහෙවර පිළිබඳ අවධාරණය කළ ආලෝකන චින්තකයන් අතර ඩෙනී ඩිඩෙරෝ (Denis Diderot 1713-1784) වැදගත් වේ. ඩිඩෙරෝ මෙකල සිටි ප්‍රමුඛත ම කලා විචාරකයා ද විය. යහගුණ හා සදාචාරය (Virtue) ආකර්ෂණීය ව පෙන්වීමක් නරක (Vice) කෙරෙහි පිළිකුල ඇති කිරීමත් අවංක කලාකරුවෙකුගේ අරමුණ විය යුතු ය යන අදහස ඩිඩෙරෝ අවධාරණය කළේ ය.[7] එමෙන් ම ඩිඩෙරෝ කලාව තුළින් සමාජ යථාර්ථය පෙන්විය යුතු

බව තරයේ ප්‍රකාශ කළේ ය. ශර්ඩැන්ගේ සිතුවම් ඩිඩෙරොගේ නිරන්තර පැසසුමට ලක් වූයේ රොකොකො සම්ප්‍රදායෙන් මිදී ආලෝකන අදහස් හා සැසඳෙන තාර්කිකත්වයකින් හා සත්‍යතාවයකින් යුතුව ජීවිතය නිරූපණය කළ බැවිනි. එවකට සිටි ප්‍රධානත ම රොකොකො ශිල්පී ප්‍රංශුවා බුශේගේ (François Boucher 1703-1770) චිත්‍ර දැඩි ලෙස විවේචනය කරමින් ඩිඩෙරො ප්‍රකාශ කළේ බුශේ සතුව 'සත්‍යය හැරෙන්නට අන් සෑම දෙයක් ම ඇත' යනුවෙනි. (That man has everything except truth)

ශර්ඩෑං මෙන් ම ග්‍රෑස් ද චිත්‍ර නිර්මාණය කළේ කලාව පරිභෝජනය කළ සමාජ පංති වෙනස් වෙමින් පැවති අවධියක ය. රොකොකො කලාව පෝෂණය කළ දැඩි සමාජ ස්ථරායනය මේ වන විට බිඳ වැටෙමින් පැවති අතර, ආලෝකන අදහස්වලින් ප්‍රබෝධමත් වූ නව මධ්‍යම පාංතිකයන් සමාජ ආර්ථික පද්ධතියේ වැදගත් තැනක් හිමි කරගෙන සිටි අතර ඔවුහු ශර්ඩෑං හා ග්‍රෑස් වැනි ශිල්පීන් නිර්මාණය කළ සැබෑ ජීවිතය නිරූපිත කලා නිර්මාණ වටා ඒකරාශි වූහ.

## පුරාතන සම්භාව්‍ය සංස්කෘතිය පිළිබඳ ඇති වූ උද්යෝගය

දහඅට වන සියවසේ දී පුරාතන සම්භාව්‍ය සංස්කෘතිය පිළිබඳ ව ඇති වූ මහත් උද්යෝගය නවසම්භාව්‍යවාදයේ සෛද්ධාන්තික පසුබිම සකස් වීමට ප්‍රධාන හේතුව විය. යුරෝපීය කලාව තුළ මෙලෙස සම්භාව්‍ය සංස්කෘතිය පිබිදීම පුනරුද අවධියේ සිට සිදුවෙමින් පැවති ක්‍රියාදාමයකි. පුනරුද අවදියේ රෆායෙල් සාන්ත්සියො (Raffaello Sanzio 1483 - 1520) ගේ සිට පසුකාලීන ව බැරොක් අවධියේ නිකොලා පුසෑං (Nicolas Poussin 1594 - 1665) හා ක්ලෝඩ් ලොරේන් (Claude Lorrain 1604 - 1682) වැනි ශිල්පීන්ගේ ක්‍රියාකාරකම් යුරෝපීය කලාව තුළ සම්භාව්‍ය අගයන් පවත්වාගෙන ආ ප්‍රණාලයන් විය. නමුත් දහඅට වන සියවස වන විට යුරෝපය තුළ කලාව නිෂ්පාදනයෙහි මෙන් ම රස වින්දනයෙහි සම්භාව්‍ය පෞරාණිකත්වයේ ප්‍රබෝධය සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබේ. සම්භාව්‍ය සංස්කෘතිය කෙරෙහි වර්ධනය වූ මෙම ඇල්ම ශාස්ත්‍රීය පර්යේෂණයන්ගේ සිට පොදු ජන සමාජයේ විලාසිතා හා ගෘහ

අලංකරණ මෙන් ම දේශපාලනික හා සමාජීය පද්ධතිය තුළ පුළුල් ව ව්‍යාප්ත විය. මේ සඳහා මූලික හේතුව වූයේ සම්භාව්‍ය සංස්කෘතියේ අගයන් ආලෝකන චින්තකයන් අපේක්ෂා කළ පරමාදර්ශයන් සමග සංගත වීමයි. ආලෝකන චින්තකයන් අවධාරණය කළ තාර්කිකත්වය (Rationality) සම්භාව්‍ය කලාව තුළින් හඳුනාගත හැකි විය. සම්භාව්‍ය කලාවේ හා ගෘහ නිර්මාණයන්හි තිබූ ජ්‍යාමිතික සංගතිය (Geometrical Harmony) තුළ ආලෝකන පරමාදර්ශයන් අන්තර්ගත කළ හැකි විය. එමෙන් ම සම්භාව්‍ය සංස්කෘතිය ශිෂ්ට සමාජයේ උත්කෘෂ්ටතම අවස්ථාව නිරූපණය කළ බැවින්, ආලෝකන දේශපාලනය හා ප්‍රජා සංවිධානය සඳහා මූලාකෘතීන් ලෙස ග්‍රීසිය හා රෝමය යොදා ගැනුණි.[8] මේ කාලය වන විට යුරෝපය හා ඇමරිකාව පුරා වර්ධනය වෙමින් පැවති කැළඹිලි සහගත දේශපාලන වාතාවරණය තුළ සම්භාව්‍ය සංස්කෘතියේ නිදහස, ප්‍රජා සදාචාරය, සාරධර්ම පිළිබඳ සම්ප්‍රදායන්, සිවිල් සමාජය ප්‍රතිසංවිධානය කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදී අදහස් ප්‍රචලිත කිරීම සඳා පරමාදර්ශී ආකෘති ලෙස යොදා ගැනීමට ආලෝකන චින්තකයෝ උත්සාහ කළහ.

සම්භාව්‍ය කලාව පිළිබඳ උද්යෝගය වර්ධනය වීම සඳහා ඉතාලියේ රෝමය ආශ්‍රිත ව සිටි ජාත්‍යන්තර විද්වතුන් සමූහයකගේ අදහස් ද ඉවහල් විය. 1755 දී ඉතාලියට පැමිණි වින්කල්මාන් පුරාතන සම්භාව්‍ය සංස්කෘතිය පිළිබඳ මහත් උනන්දුවකින් කටයුතු කළේ ය. විශේෂයෙන් ග්‍රීක සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කළ ඔහු ග්‍රීක භාෂාව ද හැදෑරී ය. පෞරාණික කලා කෘතිවල ශෛලිය පිළිබඳ ව විශේෂ අවධානයකින් යුතු ව අධ්‍යයනය කළ වින්කල්මාන් විසින් 1755 දී ප්‍රකාශයට පත් කළ "Reflections on the Imitation of Greek Works in Painting and Sculpture" නම් කෘතිය නව පර්යේෂණ ක්‍රමවේදයන්ට අනුව රචනා කර ඇති අතර එය නූතන කලා ඉතිහාසය අධ්‍යයනයට ද පදනම සැකසී ය. ඉතිහාසවේදය (Historiography) හා ආලෝකන අදහස් සුසංයෝගයෙන් වින්කල්මාන් සම්භාව්‍ය කලාකෘති ඓතිහාසික වශයෙන් මෙන් ම, භාවාත්මක හා සෞන්දර්යාත්මක වශයෙන් ද අර්ථ ගැන්වීමට උත්සාහ කළේ ය. වින්කල්මාන් විසින් 1764 දී ප්‍රකාශයට පත් කළ "History of Ancient Art" ඔහුගේ අනෙක් වැදගත් කෘතිය වේ. මෙම ග්‍රන්ථ දෙකෙන් ම වින්කල්මාන් උත්සාහ ගෙන ඇත්තේ ග්‍රීක කලාවේ හා සංස්කෘතියේ උසස් බව අවධාරණය

කිරීමටයි.[9] පෞරාණික කලාව අධ්‍යයනය මගින් විශේෂයෙන් ග්‍රීක කලාව අධ්‍යයනය මගින් පමණක් අද්විතීය තත්ත්වයකට පත්විය හැකි බව ඔහුගේ අදහස විය. කලාව යනු ජීවය අනුකරණය කිරීමය යන මතය ප්‍රතික්ෂේප කළ වින්කල්මාන් ස්වභාවික තත්ත්වයන්ට වඩා උසස් ගුණාංගයන් ග්‍රීක කලාව තුළින් හමුවන බව අවධාරණය කළේ ය. ග්‍රීක කලාවේ උදාරත්වය පිළිබඳ වින්කල්මාන්ගේ පරම උදාහරණය වූයේ ඇපලෝ බෙල්විඩර් (Apollo Belvedere) මූර්තියයි. එමෙන් ම බෙල්විඩර් අංගනය ආශ්‍රිත ලැඔකූන් (Laocoön) හා බෙල්විඩර් කවන්ධය (Belvedere Torso) ද ඔහුගේ විශේෂ අවධානයට හා පැසසුමට ලක් විය. මෙම උදාහරණ ඇසුරින් ඔහු සම්භාව්‍ය පරමාදර්ශී අලංකාරය (Ideal Beauty) "Noble simplicity and quiet grandour" යනුවෙන් අරුත් ගැන්වී ය.[10]

වින්කල්මාන්ගේ මෙම අදහස් නවසම්භාව්‍ය කලාවේ පදනම සැකසීමට මෙන් ම සම්භාව්‍ය කලාව පිළිබඳ යුරෝපය පුරා උනන්දුවක් ඇති කරවීමට ද සමත් විය. රෝමයේ සිටි ප්‍රධානත ම කලා කෘති එකතු කරන්නා වූ කාදිනල් ඇලෙස්සන්ද්‍රො අල්බානි (Alessandro Albani 1692-1779) මෙම කාර්යයේ දී වින්කල්මාන්ගේ සුසාධ්‍යකාරකයා විය. කාදිනල් අල්බානි සමග එක්ව කටයුතු කිරීම වින්කල්මාන්ගේ පර්යේෂණ කටයුතුවලට මෙන් ම නවසම්භාව්‍යවාදී කලාවේ වර්ධනයට මහත් පිටුවහලක් විය. කාදිනල් අල්බානිගේ ඉල්ලීම පරිදි වින්කල්මාන් ඔහුගේ කලා කෘති එකතුව විධිමත් ලෙස වර්ගීකරණය කොට සංවිධානය කළේ ය.

වින්කල්මාන්ගේ අදහස් හා නව ක්‍රමවේද මෙන් ම ඔහුගේ ලේඛනයන් නවසම්භාව්‍යවාදී විද්වතුන් මෙන් ම කලාකරුවන් ද සක් ප්‍රබෝධමත් කිරීමට සමත් විය. වින්කල්මාන්ගේ අදහස්වලින් ප්‍රබෝධමත් වූ කලා ශිල්පීන් අතර ඇන්ටන් රෆායෙල් මෙන්ග්ස්, ඇන්ජලිකා කෆ්මාන් හා ශාක් ලුයී දවීද් වැදගත් වේ. රෝමයේ දී වින්කල්මාන්ගේ සමීපත ම මිතුරා වූ මෙන්ග්ස් විසින් අල්බානි මන්දිරයේ (Villa Albani) ඇඳි 'පර්නාසස්' (Parnassus 1761) සිතුවම නවසම්භාව්‍යවාදී ප්‍රවණතාවයේ පළමු සිතුවම ලෙස සැලකේ. එම සිතුවම වින්කල්මාන්ගේ සම්භාව්‍යවාදී අදහස්වලින් මෙන් ම සම්භාව්‍ය කලාවෙන් මෙන්ග්ස් ලැබූ ප්‍රබෝධය පෙන්වයි.

වින්කල්මාන්ගේ පර්යේෂණ පමණක් නොව දහඅට වන සියවසේ යුරෝපයේ ශාස්ත්‍රීය පර්යේෂණ බොහොමයක් සම්භාව්‍ය ලෝකය කේන්ද්‍ර කර ගනිමින් සිදු විය.[11] මෙලෙස සම්භාව්‍ය ලෝකය පිළිබඳ කෙරුණු අධ්‍යයනවලට ප්‍රබෝධය සැපයීමට 18 වන සියවස මුල සිට ම ග්‍රීසියේ හා රෝමයේ නගර ආශ්‍රිත ව සිදු කළ නව පුරාවිද්‍යාත්මක සොයාගැනීම් හේතුවක් විය. ඇතැන්ස් (Athens), නේපල්ස් (Naples), පීස්ටම් (Paestum), පැල්මයිරා (Palmyra), බාල්බෙක් (Baalbek), හා ඩැල්මේෂියාව (Dalmatia) ආශ්‍රිත ව අළුතින් සොයා ගන්නා ලද සම්භාව්‍ය නෂ්ටාවශේෂ හා කෞතුක වස්තු මෙකල සම්භාව්‍ය කලාව පිළිබඳ ඇතිවූ උද්යෝගය තීව්‍ර කිරීමට සමත් විය. විශේෂයෙන් නේපල්ස් හි පොම්පෙයි (Pompeii) හා හර්කියුලේනියම් (Herculaneum) යන ඉපැරණි රෝම නගරද්වය ආශ්‍රිත නව කැණීම් ආරම්භ වූ අවධියේ (හර්කියුලේනියම් 1738 දී හා පොම්පෙයි 1748 දී) සම්භාව්‍ය ලෝකය පිළිබඳ පැවැති අති මහත් උද්යෝගය උපරිම තත්ත්වයකට ගෙන ඒමට එම සොයාගැනීම් ඉවහල් විය. එම උද්යෝගය නිසා ම මෙම සොයාගැනීම් ක්ෂණික ව මහත් ප්‍රසිද්ධියට පත් විය. මෙම සොයාගැනීම් මගින් ඒ වන විට නවසම්භාව්‍යවාදීන් ගොඩනගාගෙන තිබූ සිද්ධාන්ත පුරාවිද්‍යාත්මක ව නිරවද්‍යතාවයකින් යුතුව තහවුරු කර ගැනීමට හැකි විය. එමෙන් ම පෞරාණික සම්භාව්‍ය නගර හා ගෘහ නිර්මාණ, ලේඛන, හෝ සැලසුම් මගින් නොව සජීවී ව දැකගැනීමේ හැකියාව ලැබීම නිසා විද්වතුන් අතර මහත් ජනප්‍රියත්වයට පත් විය.

දහහත් වන සියවසේ අගභාගයේ ඇරඹී මේ කාලය වන විට ඉමහත් ජනප්‍රියත්වයට පත් ව තිබූ මහා සංචාරයට (Grand Tour) ද මෙම නව පුරාවිද්‍යාත්මක ස්ථාන සොයා ගැනීම මගින් නව ජීවයක් ලැබිණි. මහා සංචාරයේ නියුතු සංචාරකයන් හා විද්වතුන් මෙන් ම කලා කෘති එකතු කරන්නන් විසින් කැණීම් මගින් සොයා ගත් භාණ්ඩ මහත් උද්යෝගයකින් යුතුව මිල දී ගෙන සිය රටවලට ගෙන යාම සම්භාව්‍ය කලාව හා සංස්කෘතිය ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත වීමට තවත් හේතුවක් විය. 1764 - 1800 කාලය තුළ නේපල්ස් හි බ්‍රිතාන්‍ය තානාපති ව සිටි විලියම් හැමිල්ටන් (William Hamilton) මෙලෙස මහත් අභිරුචියකින් කලා කෘති එකතු කළ අයෙකි. පොම්පෙයි හා හර්කියුලේනියම් ආශ්‍රිත ව හමු වූ සිතුවම් සහිත

බඳුන් හා වෙනත් පුරාවස්තු රැසක් ඔහු 1772 දී බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට විකිණුවේ ය.[12] මෙම පුරා වස්තු මහජනයාට විවෘත වීම මගින් සම්භාව්‍ය කලාව හා සංස්කෘතිය ප්‍රචලිත විය.

කැණීම් මගින් මතු කරගත් නගර හා කෞතුක වස්තූන් පිළිබඳ විධිමත් ලෙස අධ්‍යයන කර සිතුවම්, රූප සටහන් සහ නිවැරදි මිනුම් සහිත සැලසුම් සමග පළ කළ වාර්තා හා ග්‍රන්ථ ප්‍රකාශයට පත් කෙරුණු අතර යුරෝපය පුරා විද්වතුන් අතර ඒවා ව්‍යාප්ත විය. හර්කියුලේනියම් හි නෂ්ටාවශේෂ හා පුරාවස්තු පිළිබඳ "Antiques of Herculaneum Exposed" නම් ග්‍රන්ථය ප්‍රකාශයට පත් විය. 1757 සිට 1792 දක්වා වෙළුම 8 කින් ප්‍රකාශයට පත් වූ මෙම ග්‍රන්ථය සම්භාව්‍ය කලාවේ දෘශ්‍ය ආකෘති සොයමින් සිටි නව සම්භාව්‍යවාදී ශිල්පීන්ට හා ගෘහ නිර්මාණ ශිල්පීන්ට ප්‍රබෝධය සැපයී ය. මෙලෙස අඛණ්ඩ ව කැණීම් කටයුතු සිදු කෙරුණු අනෙක් ස්ථාන අතරින් ඇතැන්ස්, පැල්මයිරා, බාල්බෙක්, හා ඩැල්මේෂියානු වෙරළ ආශ්‍රිත නටඹුන් ඉමහත් ප්‍රසිද්ධියට පත් විය. එමෙන් ම මෙම නව සොයා ගැනීම් පිළිබඳ පර්යේෂණ කළ විද්වතුන් හා පුරාවිද්‍යාඥයින් අතර ග්‍රන්ථ පළ කිරීමේ තරඟකාරී ස්වභාවයක් ද ඇති විය. ඇතැන්ස් හි පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳ ග්‍රන්ථයක් පළ කිරීමට ප්‍රංශ ජාතික ශූලියන් දවීද් ලෙ රෝ (Julien David Le Roy 1724-1803) සමඟ බ්‍රිතාන්‍ය ජාතික ජේම්ස් ස්ටුවට් (James Stuart 1713–1788) හා නිකලස් රෙවට් (Nicholas Revett 1720–1804) තරඟයක යෙදී සිටියහ.[13] ලෙ රෝ ඇත්න්ස් හි ස්මාරක හා නෂ්ටාවශේෂ මාස තුනක් වැනි කෙටි කලකින් පුළුල් ලෙස අධ්‍යයනය කර ඒවායේ සංස්කෘතික සන්දර්භය මෙන් ම, ඒවායින් රෝම කලාවට ලැබුණු ආභාසය පිළිබඳ ව ද විග්‍රහ කරමින්, නිවැරදි මිනුම් හා විස්තර සහිත ව සිතුවම් හා සැලසුම් සමග "The Ruins of the Most Beautiful Monuments of Greece" නම් ග්‍රන්ථය 1758 දී ප්‍රකාශයට පත් කළේ ය. ස්ටුවට් හා රෙවට් දෙදෙනා ගැවින් හැමිල්ටන් සහ ගෘහනිර්මාණ ශිල්පී මැතිව් බ්‍රෙටින්ග්හැම් (Matthew Brettingham 1699-1769) සමග එක්ව නේපල්ස් හා ග්‍රීසියේ පුරා වස්තු අධ්‍යයනය කරමින් වසර 4 ක පමණ කාලයක් ගත කළ බැවින් ඔවුන්ගේ ග්‍රන්ථය "The Antiquities of Athens and Other Monuments of Greece" පළ කරනු ලැබුවේ 1762 දී ය.

මේ අවධියේ පුරාවිද්‍යාත්මක කැණීම්වලින් මතු වූ සම්භාව්‍ය ස්මාරක පිළිබඳ ව රචිත තවත් වැදගත් ග්‍රන්ථයක් වන්නේ 1764 දී රොබට් ඇඩම් (Robert Adam 1728-1792) විසින් පළ කළ "Ruins of the palace of the Emperor Diocletian at Spalatro in Dalmatia" ග්‍රන්ථයයි. ඩැල්මේෂියානු වෙරළ තීරය ආශ්‍රිත ව පැවැති ඩයික්ලෝටියන් (Diocletian) අධිරාජයාගේ මාලිගය නමින් හඳුන්වන දැවැන්ත ගොඩනැගිලි සංකීර්ණය විධිමත් ලෙස මැනුම් කර සැලසුම් සහ විස්තර සහිතව ඔහු ලේඛන ගත කළේ ය. වින්කල්මාන් මෙන් ම ඇඩම් ද විශ්වාස කළේ පෞරාණිකත්වය දැනුමේ මෙන් ම රසාස්වාදයේ ද ප්‍රභවය බවයි. බ්‍රිතාන්‍යයේ නවසම්භාව්‍යවාදී ගෘහ නිර්මාණ කලාවේ ප්‍රබලතමයා වූ ඇඩම්ගේ ශෛලිය හැඩගැස්වීමට මෙම පර්යේෂණ මගින් විශාල ප්‍රබෝධයක් ලද අතර ම ඔහුගේ ග්‍රන්ථය යුරෝපය පුරා ශිල්පීන්ට සම්භාව්‍ය කලාව පිළිබඳ ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් විය.

මෙලෙස ප්‍රකාශයට පත් ග්‍රන්ථ හා ලේඛන යුරෝපය පුරා ඒකාකාර ධාරිතාවයකින් ව්‍යාප්ත නොවුව ද මේවායින් යුරෝපයේ විවිධ ක්ෂේත්‍රවල නියුතු කලාකරුවන් හා ශිල්පීන් සිය කලා ශෛලිය ප්‍රබෝධමත් කර ගත් අතර එමගින් නවසම්භාව්‍යවාදී කලාව පෝෂණය විය.

එතෙක් පැවැති රදළ සමාජයේ නිස්සාර සැරසිලි සහිත කෘත්‍රිම තත්ත්ව නිරූපණය ආලෝකන අදහස් මගින් දැඩි ලෙස ප්‍රතික්ෂේප වූ බව දැක ගත හැකි ය. එමෙන් ම ආලෝකන අදහස්වලින් පෝෂණය වූ නව මධ්‍යම පාංතිකයෝ ද රොකොකො කලාවේ අතාත්වික, කෘත්‍රිම නිරූපණය බැහැර කළහ. දහඅට වන සියවසේ දී ඇති වූ ආලෝකන අදහස් නවසම්භාව්‍යවාදී කලාව නිෂ්පාදනයට අවශ්‍ය කතිකාමය අවකාශය සකසා දී ඇති බව පැහැදිලි ව පෙනේ. ආලෝකන චින්තනයේ හරය හා සැසඳෙන සම්භාව්‍ය සංස්කෘතියේ අගයන් මූලාකෘතීන් ලෙස ආදර්ශයට ගැනීමට යොමුවීම නවසම්භාව්‍ය කලාවේ සෛද්ධාන්තික පදනම සකස් කිරීමට උපකාරී වී ඇත. වින්කල්මාන් ප්‍රමුඛ ව ජාත්‍යන්තර විද්වතුන් රැසකගේ ශාස්ත්‍රීය පර්යේෂණයන්ගේ ඵලයක් ලෙස සම්භාව්‍ය සංස්කෘතියේ දෘශ්‍ය ආකෘතීන් මෙන් ම සෞන්දර්යාත්මක හර පද්ධතිය ද කැටිකර ගනිමින්

නවසම්භාව්‍යවාදී කලාව පෝෂණය වී ඇත. 18 වන සියවසේ මුල්භාගයේ සිට ග්‍රීසිය හා රෝමය ආශ්‍රිත ව අඛණ්ඩ ව ක්‍රියාත්මක ව පැවති නව පුරා විද්‍යාත්මක සොයාගැනීම් නවසම්භාව්‍යවාදී සෛද්ධාන්තික පදනම පුරාවිද්‍යාත්මක ව තහවුරු කිරීමට මෙන් ම තවත් ශක්තිමත් කිරීමට සමත් වී ඇත. සම්භාව්‍ය සංස්කෘතිය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේද ඇසුරෙන් අධ්‍යයනය කර ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ, ලේඛන, හා වාර්තා මගින් නවසම්භාව්‍යවාදී ප්‍රවණතාවය යුරෝපය පුරා ව්‍යාප්ත වීම කෙරෙහි බලපා ඇත.

**ආන්තික සටහන්**

1. Chilvers, 1996, p. 364.
2. Chilvers, 1996, p. 364.
3. Palmer, 2011, p. 1.
4. Tarabra, 2008, p. 109.
5. Cunningham, 1982, p. 529.
6. Kleiner, 2013, p. 737.
7. Diderot, 2010, p. 184.
8. Kleiner, 2013, p. 745.
9. Chilvers, 1996, p. 574.
10. Bietoletti, 2009, p. 9.
11. Kleiner, 2013, p. 746.
12. Kleiner, 2013, p.745.
13. Lefaivre, & Tzonis, 2004, p. 358.

**මූලාශ්‍රය නාමාවලිය**

Bietoletti, S. (2009). **Neoclassicism and romanticism**. New York: Sterling Pub.

Chilvers, I. (1996). **The Oxford dictionary of art**. Oxford Oxfordshire: Oxford University Press.

Cunningham, L., & Reich, J. (1982). **Culture and values: A survey of the Western humanities**. New York: Holt, Rinehart and Winston.

Diderot, D., & Seznec, J. (2010). *On art and artists an anthology of Diderot's aesthetic thought*. Dordrecht: Springer.

Kleiner, F. (2013). *Gardner's art through the ages: A global history. 14th ed. Vol. 2.*

Lefaivre, L., & Tzonis, A. (2004). *The emergence of modern architecture: A documentary history from 1000 to 1810*. London: Routledge, Taylor & Francis Group.

Palmer, A. (2011). *Historical dictionary of neoclassical art and architecture*. Lanham [Md.: Scarecrow Press.

Tarabra, D. (2008). *European art of the eighteenth century*. Los Angeles: J. Paul Getty Museum.